

මහාචාර්ය ඩී. ජේ. විජයරත්න මහතා

# මහාචාර්ය ඩී. ජේ. විජයරත්න මහතා

මහාචාර්ය ජිනදාස දනන්සූරිය

ක්‍රි. ව. 1908 ජනවාරි මස 08 වන දින ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පත්තුවේ හප්පාවන නමැති වූ ග්‍රාමයෙහි ප්‍රභූ පවුලක ලාබාල ම සාමාජිකයා වශයෙන් උපත ලැබූ ඩැනියෙල් ජිනදාස විජයරත්න මුලින් ම ඉගෙනීමට අත පොත් තැබුවේ ගමේ පන්සලෙහි. හප්පාවන සත්දැඩ පන්සලේ අධිපතිව වැඩ වාසය කළ පූජ්‍ය කතළුවේ ගුණානන්ද හිමියන් වෙතින් නාමපොත, මගුල් ලකුණ, වදන්කවිපොත හා සකස්කඩය වැනි සාම්ප්‍රදායික අධ්‍යාපන පටිපාටියට අයත් පාඨ ග්‍රන්ථ හදාරා ඉගෙනීමේ කටයුතු ආරම්භ කළ විජයරත්න දරුවා එකල ම ප්‍රාචීන භාෂා කෙරෙහි ද නැඹුරු විය.

ක්‍රි. ව. 1914 දී ඔහු පිලානේ වැස්ලියන් මෙතෝදිස්ත මිශනාරි පාඨශාලාවට ඇතුළු වී එහි අටවැනි පන්තිය දක්වා ශාස්ත්‍ර හදාළේ ය. පාසලේ හොඳ ම සිසුවා මෙන් ම දක්ෂතම ශිෂ්‍යයා ද වූ ඔහු පසළොස් හැවිරිදි වියේ දී එහි ම උප ගුරුවරයකු වශයෙන් පත් කරනු ලැබී ය. ඒ පාසලේ වසරක ගුරු සේවාවෙන් පසුව ඔහු වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ රාත්‍රී ඉංග්‍රීසි පාඨශාලා කිහිපයකට ඇතුළු විය. කොළඹ දකුණු ජේකබ් පාරේ පිහිටි ලෝරන්ස් කොලේජ්, ඔහු අවසන් වරට ඉංග්‍රීසි භාෂාව හදාළ විද්‍යාලය විය. ඒ විදුහලින් පාසල් හැර යාමේ ඉංග්‍රීසි විභාගය (E.S.L.C) සමත් වූ ඔහු ඉක්බිතිව 1933 වර්ෂයේ ඉංග්‍රීසි හා ලතින් භාෂා සමඟ ලන්ඩන් මැට්‍රිකියුලේෂන් විභාගය සමත් වී විශ්වවිද්‍යාලයට ඇතුළු වීමට සුදුසුකම් ලැබීය.

1935 වර්ෂයේ කොළඹ යුනිවර්සිටි කොලීජියට බැඳුණු විජයරත්න තරුණයා, සංස්කෘත, සිංහල, ශුද්ධ ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් හදාරා 1937 වසරේ අතර කලා පරීක්ෂණයෙන් සමත් විය. ඒ වසරේ ම ඔහුට University College Exhibition නමැති ශිෂ්‍යත්වය හිමි විය. ඔහු 1939 වර්ෂයේ යුනිවර්සිටි කොලීජියෙහි පැවැත්වුණු සිංහල විශේෂවේදී ඩිප්ලෝමා පරීක්ෂණයෙන් ප්‍රථම පන්තියේ ගෞරව සාමාර්ථයක් හිමි කර ගනී. ඉක්බිතිව සංස්කෘත